# මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2023/2024

## -මෙහි සඳහන් සියලු උපදෙස් හොඳින් කියවා තේරුම් ගන්න-

1) 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ නාම ලේඛනය ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ (welfare.sjp.ac.lk) පළ කර ඇත.

2) නාම ලේඛනයෙහි නම සඳහන් සියලුම සිසුන් (නම සඳහන් වුවත් **අධ්‍යයන වර්ෂ කල් ගත් සිසුන් ඇතුලුව**) ඒ සඳහා ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි වීමේ පෝරමය www.mahapola.lk යන වෙබ් අඩවියට පිවිස http://www.mahapola.lk/BankApp2024/ සබැඳිය හරහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කිරීමෙන් ලබාගත හැකිය.

3) සම්පූර්ණ කරන ලද පෝරමය සෘජුවම (Online) මහපොළ අරමුදල වෙත **2025.06.30** දින හෝ ඊදිනට පෙර යොමු කළ යුතුය. (Online Submit කිරීම)

4) ඔබ බාගත කරන ලද ලියාපදිංචි වීමේ පෝරමයේ ඉහළ අධ්‍යයන වර්ෂය **2023 / 2024** ලෙස සටහන්ව තිබිය යුතු අතර එසේ සටහන්ව ඇත්දැයි හොඳින් බලන්න. එසේ නොමැති නම් නිවැරදි පෝරමය නැවත බාගත කරගන්න.

5) එම පෝරමයේ ඔබේ **අත්සන** යොදා **ලියාපදිංචි අංකය** පැහැදිලිව සටහන් කර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුබසාධක අංශය වෙත **2025.07.07** දින හෝ ඊදිනට පෙර ගෙනවිත් බාර දිය යුතුය. **(මහපොළ ශිෂ්‍යත්වලාභියා සතුවද පිටපතක් තබා ගැනීම අනිවාර්ය වේ).**

6) **බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්** ලියාපදිංචි වීමේ පෝරමය සමඟ අමුණා තිබිය යුතු අතර E - පාස්පොත් ඇති සිසුන් තම ගිණුමට අදාල බැංකුවෙන් ලබාගන්නා ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම් සත්‍ය පිටපත් බව තහවුරු කිරීම අත්‍යවශ්‍ය නොවේ).

7) මෙම ගිණුම ශිෂ්‍යත්වලාභියාගේ නමට අයත් **ලංකා බැංකුවේ** හෝ **මහජන බැංකුවේ** ගිණුමක් විය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුයි.

8) ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුම් අංකය පසුව වෙනස් කළ නොහැකි අතර **සක්‍රීය ගිණුම් අංකයක්** ඉදිරිපත් කළ යුතුවේ. (Submit කිරීමට ප්‍රථම ගිණුම් අංකය නිවැරදි දැයි නැවත දෙවරක් පරීක්ෂා කර බලන්න. Submit කළ පසු නැවත සංස්කරණය කළ නොහැක).

9) **ගිණුම් අංකය පසුව වෙනස් කරනු ලබන සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් මහපොළ ශිෂ්‍යත්වභාර අරමුදල විසින් අත්හිටුවනු ලබයි.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ශිෂ්‍ය සුබසාධක අංශය
2025.06.19

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.